**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය - (ණය අංක 2757-එස්ආර්අයි – 2013**

---

**ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ** 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) හා ආසියානු සංවර්ධන බැංකුව (ආසබැ) අතර 2011 ජූලි 22 දින එළඹි ව්‍යාපෘති ගිවිසුමේ (අ) ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ද්විතියික නගර හා ග්‍රාමීය ප්‍රජා මූල ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව , ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය (ජාජසජම) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, 969,000 ක් වන ජනතාවට පිරිසිදු ජලය සැපයීම හා නාගරික ප්‍රදේශ පහක හා උතුරු මැද පළාතේ ග්‍රාමීය ප්‍රදේශවල 171,500 ක් වන ජනතාවට සනීපාරක්ෂක පහසුකම් ලබාදීම සහ ජල අංශ සම්බන්ධ ආයතන ශක්තිමත් කිරීම මඟින් පිරිසිදු ජලය සැපයීම සඳහා ශ්‍රී ලංකා රජයේ ධාරිතාවය වැඩි කිරීමයි. ආසියානු සංවර්ධන බැංකුව විසින් ශ්‍රී ලංකා රජයේ කොටසද ඇතුළත්ව එජඩො මිලියන 85.6 ක් වූ අංක 1993 එස්ආර්අයි- (එස්එෆ්) දරන ණය 2003 අගෝස්තු 18 දින අනුමත කරන ලදි. ව්‍යාපෘතියේ අතාත්වික මූල්‍යයනය හා එහි ආරම්භක ඇගයීමේ සිට මිල ඉහළයාම් හේතුවෙන් මුතූර් ජලපවිත්‍රාගාරය සහ පිරිසිදු ජල බෙදාහැරීම් සහ ප්‍රධාන වැඩ කොන්ත්‍රාත් වෙනුවෙන් උපකරණ හා ද්‍රව්‍ය පිරිවැය දැරීමට අතිරේක ණය මුදලක් (ණය අංක 2757 එස්ආර්අයි) සැපයීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟවී තිබුණි. අතිරේක ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 5.2 ක් වන අතර එයින් එජඩො මිලියන 4.3 ක් එනම් සියයට 82.69 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව සහ එජඩො මිලියන 0.9 ක් එනම් සියයට 17.31 ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය (ශ්‍රීලංර) එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2014 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය හා මතය සඳහා පදනම

--------------------------------------------

මාගේ විගණන පරික්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරික්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදි. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරික්ෂා කිරීම් ද එම පරික්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මුල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වු වත්කම් හා වගකීම් , ණය යටතේ මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්ම පදනම් කර ගෙන මුල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපුර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් ඉස්මතු කොට පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබු යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**3. මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 5 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැර , මාගේ මතය වනුයේ;

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ අග්‍රිම අරමුදල් ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව හා 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමේ නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**4.1** **මූල්‍ය කාර්ය සාධනය**

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකි වූ තොරතුරු අනුව , 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.275,613,175 ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.567,349,147 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම හා ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| **විෂයය** | **දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම** | | **2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම** |
|---|---|---|---|
| | **2013** | **2012** | |
| | රු. | රු. | රු. |
| උපකරණ හා ද්‍රව්‍ය | 273,427,058 | 288,401,215 | 563,293,496 |
| පොලී ගාස්තු (අතිරේක ) | 2,186,117 | 1,189,533 | 4,055,651 |
| එකතුව | 275,613,175 | 290,270,748 | 567,349,147 |

4.2 අග්‍රිම අරමුදල් ගිණුම

ව්‍යාපෘතිය විසින් පවත්වා තිබුණු පොත්පත් හා වාර්තා අනුව සහ ලබාගත හැකි වූ තොරතුරු අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අග්‍රිම අරමුදල් ගිණුමේ මෙහෙයුම් සහ 2013 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ පැවති ශේෂය පහත දැක්වේ.

| | එජඩො | රු. |
|---|---|---|
| 2013 ජනවාරි 01 දිනට ශේෂය | 335,485 | 42,660,490 |
| එකතුකළා :- | | |
| ඌන පූර්ණයන් | - | - |
| විදේශ විනිමය වාසිය | - | 939,694 |
| | ------------- | ------------- |
| | 335,485 | 43,600,184 |
| අඩුකළා :- ආපසු ගැනීම් | 303,077 | 39,362,742 |
| | ------------- | ------------- |
| 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය | 32,408 | 4,237,442 |

**5. විගණන නිරීක්ෂණ**

**---------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විදේශ විනිමය අනුපාතවල ශුද්ධ වෙනස වූ රු. මිලියන 3.5 ක් අනුචිත ලෙස මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි සහ ලැබීම් හා ගෙවීම් ගිණුමේ දක්වා තිබුණු උපකරණ හා ද්‍රව්‍ය වල වටිනාකම් අතර රු. මිලියන 38 ක වෙනසක් විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 5.6 ක්වූ කොන්ත්‍රාත් වලින් සියයට එකක් කොන්ත්‍රාත් කර්මාන්ත ඇප අරමුදල් (කො.ඇ.අ) බදු අයකර දේශීය ආදායම් බදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් සිදුකරන ලද ගනුදෙනු අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.

**6. මුල්‍ය හා භෞතික කාර්ය සාධනය**

**6.1 අරමුදල් උපයෝජනය**

(අ) මුල්‍යායනය හා අයවැයගත ප්‍රතිපාදනය සම්බන්ධයෙන් ලබාගත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළ අරමුදල් උපයෝජනය සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | සැපයීම සඳහා එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ අරමුදල් උපයෝජනය | 2013 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|---|
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආසබැ | 4.30 | 485.94 | 169.77 | 168.85 | 3.20 | 399.24 |
| ශ්‍රී ලංකා රජය | 1.20 | 139.00 | 85.75 | 61.25 | 1.20 | 154.08 |
| එකතුව | 5.50 | 624.94 | 255.52 | 230.10 ★ | 4.40 | 553.32 ★ |

★ උපචිත වියදම්වල බලපෑම හේතුවෙන්, මෙම වාර්තාවේ 4.1 ඡේදයේ දැක්වෙන සංඛ්‍යාවෙන් ඉහත දැක්වෙන සංඛ්‍යාව වෙනස් වේ.

6.2 භෞතික කාර්ය සාධනය

සැලසුම් කරන ලද කාලපරිච්ඡේදය තුළ වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින් ව්‍යාපෘති අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරගනු වස් සමස්ත ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසිකව කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදී වශයෙන් වගකීම්ද සහිතව මුල්‍ය හා භෞතික ඉලක්කයන් දක්වමින්

පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ව්‍යාපෘතිය විසින් එම සැලැස්ම පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි.